# පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්

## ඩෙංගු මර්දන ජාතික වැඩසටහන

## 2026 ජූනි 15 - 20 දක්වා

### රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

2026 වර්ෂයේ දී නිරිතදිග මෝසම සක්‍රීය වීම සමඟ ඇති වූ වර්ෂා තත්ත්වය හේතුවෙන් ඩෙංගු රෝගීන් වාර්තා වීම ඉහළ ගොස් ඇත. ඒ අනුව පසුගිය මැයි මාසයේ අවසාන සතිය තුළ දී ඩෙංගු රෝගීන් 2445ක් වාර්තා වී ඇති අතර සෞඛ්‍ය වෛද්‍ය කොට්ඨාස 74ක ඩෙංගු රෝගය පැතිරීම අධි අවදානම් තත්තවයට පත් වෙමින් පවතී.

2023/06/26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2017 (II) මගින් සියලුම රාජ්‍ය ආයතන වෙත නිකුත් කරන ලද උපදෙස් ප්‍රකාරව ඩෙංගු මර්දනය ජාතික, පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ආයතනික මට්ටමින් සියලු අංශවල සක්‍රීය සහභාගිත්වයෙන්, නිරන්තරව හා විධිමත්ව ක්‍රියාත්මක කළ යුතු කාර්යයක් බවට අවධාරණය කර තිබේ.

ඒ අනුව, යමින් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිසිය සමඟ සහයෝගයෙන්, සියලුම පළාත් හා පළාත් පාලන ආයතන කේන්ද්‍ර කර ගනිමින් සහ ඔවුන්ගේ සක්‍රීය දායකත්වයෙන් රාජ්‍ය අංශය පෞද්ගලික අංශය සහ මහජනතාවගේ සහභාගීත්වයෙන් 2026/06/15 දින සිට 2026/06/20 වන දින දක්වා විශේෂ ඩෙංගු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

- පළමු දිනය - 2026/06/15
- දෙවන දිනය - 2026/06/16
- තෙවන දිනය - 2026/06/17

  පොදු ස්ථාන ආවරණය වන පරිදි ඩෙංගු මර්දන වැඩසටහන්
- සිව්වන දිනය - 2026/06/18 - අධ්‍යාපන ආයතන ආවරණය වන ඩෙංගු මර්දන වැඩසටහන්
- පස්වන දිනය - 2026/06/19 - රාජ්‍ය අංශය ආවරණය වන ඩෙංගු මර්දන වැඩසටහන්
- හයවන දිනය - 2026/06/20 - පෞද්ගලික නිවාස පිරිසිදු කිරීම.

වැඩසටහනේ ප්‍රමුඛ අරමුණ වන්නේ සියලුම පළාත් පාලන ආයතන සෞඛ්‍ය අංශයේ මඟ පෙන්වීම් සහ මාර්ගෝපදේශයන්ට අනුව, ප්‍රජා මට්ටමින්, අධ්‍යාපන ක්ෂේත්‍රය ආවරණය වන ආයතන මට්ටමින් සහ සියලු රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන මට්ටමින් ඩෙංගු ඇතුළු රෝගකාරක මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ, තිරසර අඛණ්ඩ සහ ප්‍රතිඵලදායී වැඩසටහන් ක්‍රියාත්මක කරමින් අඛණ්ඩව පවත්වාගෙන යාම වේ.

මෙහිදී පූර්ව සූදානම, ප්‍රජා සහභාගිත්වය, පාසල් දරුවන් සහ ප්‍රජාව දැනුවත් කිරීම සහ රාජ්‍ය ආයතන පරිශ්‍ර පිරිසිදු කිරීම යන තේමා ප්‍රමුඛ කරගනිමින් අවදානම අවම කිරීම සඳහා ඇවැසි ක්‍රියාමාර්ග ගනිමින් ඒවා අඛණ්ඩව ඉදිරියට පවත්වා ගැනීමට ද සැලැසුම් කෙරේ. මෙම වැඩසටහන සියලු පාර්ශව සමඟ අත්වැල් බැඳගනිමින් ඩෙංගු මර්ධනය සඳහා ඇවැසි සෘජු ක්‍රියාමාර්ග ගනිමින් සෞඛ්‍ය සම්පන්න සුරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීමේ නියමු කාර්යයභාරය ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## පළමු දිනය, දෙවන දිනය හා තෙවන දිනය 2026/06/15,16,17 - "සෞඛ්‍යාරක්ෂිත වටපිටාවක්" පොදු ස්ථාන ආවරණය වන පරිදි ප්‍රජා මට්ටමේ ඩෙංගු මර්දන වැඩසටහන්

**අරමුණ:**

නිරිතදිග මෝසම් සුළං සක්‍රිය වීමත් සමඟ වර්ෂාපතනය වැඩි වීම හේතුවෙන් ප්‍රජාව තුළ මදුරුවන්ගෙන් බෝවන ඩෙංගු හා අනෙකුත් රෝග අවදානම අවම කිරීම සහ පරිසරය පිරිසිදු කිරීම සඳහා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ ක්‍රියාකාරකම් සිදු කිරීම.

**ඉලක්කගත ආයතන / ස්ථාන:**

නගර, අවහිර වූ කාණු පද්ධති, අවහිර වූ ජලාපවහන පද්ධති, වීදි, මං මාවත්, වාණිජ ගොඩනැගිලි, වීදි, මං මාවත්, වාණිජ ගොඩනැගිලි, නගර, පොදු ක්‍රීඩාංගණ, උද්‍යාන, ආපනශාලා, සතිපොළ භූමි, වෙළඳ සැල්, ආගමික ස්ථාන, පොදු වැසිකිළි පද්ධති, බස් නැවතුම්පළ, ඉදි කිරීම් පරිශ්‍ර

**ක්‍රියාකාරකම්:**

1. මහජනතාව දැනුවත් කිරීම සඳහා සියලු ස්වේච්ඡා සංවිධාන, සමිති සහ කණ්ඩායම් දැනුවත් කරමින් පළාත් පාලන බල ප්‍රදේශය තුල ශක්තිමත් ප්‍රචාරණ වැඩසටහනක් දියත් කරමින් ප්‍රජාව දැනුවත් කිරීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කණ්ඩායම් හඳුනා ගැනීම.
2. වර්ෂාපතන තත්ත්වය සමඟ වර්ධනය විය හැකි ඩෙංගු, චිකන්ගුන්යා වැනි රෝග අවදානම සැලකිල්ලට ගෙන පළාත් පාලන ආයතන බලප්‍රදේශ තුළ මදුරු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා එක්ව පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

   I. ධූමායනය
   II. ජලය එක්රැස් වන ස්ථාන විනාශ කිරීම
   III. ජලය බැස යන පරිදි කාණු පිරිසිදු කිරීම

3. අයහපත් කාලගුණය හේතුවෙන් මළ අපපල පද්ධති පිරී යාම නිසා ඇති විය හැකි මහජන පීඩා වැළැක්වීම සඳහා ගලි බවුසර් භාවිතයෙන් වැසිකිළි වළවල් පවිත්‍ර කිරීමත් මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමටත් කටයුතු කිරීම.
4. ප්‍රදේශයේ ජලය බැස යන කාණු අවහිර වීම හේතුවෙන් ඇති විය හැකි අයහපත් තත්ත්වයන් මගහරවා ගැනීම සඳහා කාණු පද්ධති පිරිසිදු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
5. මහජන සහභාගීත්වයෙන් පොදු ස්ථාන පිරිසිදු කිරීම, අලුත්වැඩියා කිරීම, ප්‍රධාන හා අතුරු මාර්ග දෙපස ගස් අතු කපා ඉවත් කර මාර්ග පිරිසිදු කිරීම සඳහා ශ්‍රමදාන සංවිධානය කරමින් ඒවා ක්‍රියාත්මක කරවීම.
6. පරිසරය පුරා විසිරී පවතින අපද්‍රව්‍ය එනම් ප්ලාස්ටික් භාජන, ටින් බෝතල්, වීදුරු බඳුන්, පොලිතීන් නිෂ්පාදන වැනි ජලය රැස් වන සියලුම අපද්‍රව්‍ය එක් රැස් කර විධිමත්ව අපහරණය කිරීම.

7. පරිසර පොලිසියේ සහය ලබා ගනිමින් අවිධිමත් කසළ බැහැර කිරීම් වැළැක්වීම සඳහා පියවර ගැනීම.

8. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුල පවතින විවෘත කසළ බැහැර කිරීම් සිදුකරන ස්ථාන වල මදුරුවන් බෝවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම.

9. වැව්, ගංගා, ඇළ දොළ, කලපු, මුහුදු වෙරළ ආශ්‍රිත ප්‍රදේශවල අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා ප්‍රජා මට්ටමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් එම අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම.

## සිව්වන දිනය 2026/06/18 – අධ්‍යාපන ක්ෂේත්‍රය ආවරණය වන ආයතන සඳහා ඩෙංගු මර්දන වැඩසටහන්

**අරමුණ:**

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු දරුවන් සහ වැඩිහිටියන් ඩෙංගු උවදුරෙන් ආරක්ෂා කිරීම සහ දරුවන් මගින් ප්‍රජාව වෙත පණිවිඩය රැගෙන යාම.

**ඉලක්කගත ආයතන / ස්ථාන:**

රජයේ පාසල්, පෙර පාසල්, පෞද්ගලික පාසල්, ඇතුළු බල ප්‍රදේශයේ සියලුම අධ්‍යාපන ආයතන

**ක්‍රියාකාරකම්:**

1. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු දරුවන් සඳහා ඩෙංගු මර්දනය, මදුරුවන් බෝවන ස්ථාන හඳුනා ගැනීම සහ නිවසේ දී සිදු කළ හැකි සරල ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වමින් ප්‍රජාව වෙත පණිවිඩය රැගෙන යාම.

2. පාසල් ඇතුළු අධ්‍යාපනික පරිශ්‍ර පිරිසිදු කිරීම සහ ජලය එක්රැස් වන ස්ථාන විනාශ කිරීම සහ රැස් වී ඇති කසළ විධිමත්ව බැහැර කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

3. පාසල් ගුරුවරුන්, පාසල් දරුවන්, පෙර පාසල් දරුවන් සහ පෞද්ගලික අංශයේ අධ්‍යාපනයේ නියුතු දරුවන් සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හෝ ප්‍රජා සංවර්ධන නිලධාරීන් සහභාගි කරවාගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

4. “ඩෙංගු වලින් තොර කලාපයක්” යන තේමාව යටතේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ නිරන්තර අධීක්ෂණ ක්‍රමවේද හඳුන්වා දෙමින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු දරුවන් දැනුවත් කිරීම.

5. සියලුම පාසල් සහ අධ්‍යාපන ආයතන ඩෙංගු වලින් තොර කලාප බවට පත් කිරීම පිණිස වූ උපදෙස්:
   - I. පරිශ්‍රය නිතිපතා පරික්ෂා කිරීමට වගකිවයුතු නිලධාරීන් පත් කිරීම.
   - II. මදුරුවන් බෝවන ස්ථාන සතිපතා පරික්ෂාවට ලක් කිරීම.
   - III. ආයතනයේ රැස් වන කසළ වර්ගීකරණයට ලක් කර බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතන හා එක්ව විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීම.
   - IV. දරුවන් මදුරුවන් දශ්ට කිරීමෙන් වළක්වාලීම සඳහා දිවා කාලයේ මදුරු විකර්ෂකයක් භාවිතයට උපදෙස් ලබා දීම.
   - V. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා එක්ව නිරතුරුව ආයතන පරිශ්‍ර මදුරුවන් නොමැති බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
   - VI. පාසැල් මට්ටමින් ඩෙංගු මර්දන කමිටු සක්‍රීය කර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපදෙස් සහය සහ මඟපෙන්වීම ලබා දීම.

## පස්වන දිනය 2026 /06/19 - රාජ්‍ය හා පෞද්ගලික අංශය ආවරණය වන ඩෙංගු මර්දන වැඩසටහන්

**අරමුණ:**

2023/06/26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/2017 (II) මගින් **සිකුරාදා** දිනය **"ආයතනික ඩෙංගු මර්ධන දිනය"** ලෙස ප්‍රකාශයට පත් කිරීමටත්, ඒ වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් උපදෙස් ලබා දී ඇති බැවින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන පරිශ්‍ර තුළ ඩෙංගු මදුරුවන් බෝවීමට හැකි ස්ථාන හඳුනාගෙන රෝග ව්‍යාප්තිය අවම කිරීමට කටයුතු කිරීම.

**ඉලක්කගත ආයතන / ස්ථාන:**

බල ප්‍රදේශයේ සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන, ඉදිකිරීම් පරිශ්‍ර, රජය සතු සියලුම ගොඩනැගිලි සහ භූමි ප්‍රදේශ

**ක්‍රියාකාරකම්:**

1. ආයතන සේවකයින් සඳහා ඩෙංගු මර්දනය පිළිබඳ කෙටි දැනුවත් කිරීමේ වැඩසටහන්, සෞඛ්‍ය අංශ හා එක්ව සංවිධානය කිරීම.

2. සියලුම රාජ්‍ය හා පෞද්ගලික ආයතන පරිශ්‍ර පිරිසිදු කිරීම සහ ජලය එක්රැස් වන ස්ථාන විනාශ කිරීම සඳහා ආයතන පරිශ්‍ර තුළ, සියලු සේවකයින්ගේ සක්‍රිය සහභාගිත්වයෙන්, මදුරුවන් බෝවන ස්ථාන හඳුනාගෙන ඒවා විනාශ කිරීම.

3. ආයතන පරිශ්‍රය තුළ හා අවට කාණු පද්ධති, වහල, භාවිත නොවන බහාලුම් ආදිය පරීක්ෂා කර ජලය එක්රැස් වීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

4. "ඩෙංගු මුක්ත ආයතනයක්" ලෙස සියලු ආයතන පවත්වාගෙන යාම සඳහා අඛණ්ඩ අධීක්ෂණ ක්‍රමවේද හඳුන්වා දෙමින් විධිමත් යාන්ත්‍රණයක් එම ආයතන තුල ස්ථාපිත කිරීමත් වගකීම් පැවැරෙන නිලධාරීන් පත් කරමින් යාන්ත්‍රණයේ අඛණ්ඩ බව තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

5. ආයතනික ඩෙංගු මර්දන කමිටු හරහා නිරන්තර අධීක්ෂණය සහ සෞඛ්‍ය අංශ සමඟ සම්බන්ධීකරණය වෙමින් ප්‍රදේශයේ ඩෙංගු සහ බෝවන රෝග අවදානම පිළිබඳව දැනුවත් වෙමින් සුදුසු ක්‍රියාකාරකම් හඳුනාගනිමින් ක්‍රියාත්මක කිරීම.

6. සිදු කරන ලද කාර්යයන් පිළිබඳව වාර්තා සකස් කර අදාළ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කිරීම සහ අඛණ්ඩව ක්‍රියාත්මක වියයුතු අවස්ථා හඳුනා ගනිමින් ඒ සඳහා සෞඛ්‍ය අංශයේ සහය ලබා ගැනීම.

7. මහජනයා ගැවසෙන පොදු ස්ථාන අයත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන එම පරිශ්‍ර පිරිසිදු කිරීම සඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8. ආයතනයේ රැස් වන කසළ බැහැර කිරීම සඳහා පළාත් පාලන ආයතනය හා එක්ව සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ගැනීම.

9. ඉදිකිරීම් පරිශ්‍ර තුල මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා උපදෙස්:

I. ජලය රැස්විය හැකි යන්ත්‍රෝපකරණ සහ උපාංග ආවරණයක් යට තැබීම.
II. භාවිතා නොකරන භාජන සහ තාවච්, ජලය නොරැඳෙන සේ ගබඩා කිරීම.
III. ජලය රැස් කරන ටැංකි / භාජන සහ නළ ළිං වසා තබා මදුරුවන් ප්‍රවිශ්‍ය වීම අවහිර කිරීම.
IV. ජලය රැස් කරන ටැංකි / භාජන ආදියේ ඇතුළත පෘශ්ඨ දින තුනකට වරක් බුරුසුවකින් අතුල්ලා පිරිසිදු කිරීම.
V. ජලය ඉවත් කළ නොහැකි ස්ථාන / ටැංකි සඳහා කීට නාශක යෙදීම.
VI. ජලය රැස්විය හැකි ප්‍රදේශ සහ සවිකෘත ජලය නොරැඳෙන සේ සකස් කිරීම.
VII. යකඩ / PVC බට ආදී සවිකෘත තුල ජලය නොරැඳෙන සේ අගවැසුම (End Cap) දැමීම.
VIII. කාණු, සෝපාන, ළිං ආදිය තුල රැඳි ජලය නිතරම ඉවත් කිරීම.
IX. ඉවතලන ද්‍රව්‍ය , සුන්බුන් හා භාණ්ඩ නිසි ලෙස බැහැර කිරීම හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම.

## හයවන දිනය 2026/06/20 - පෞද්ගලික නිවාස පිරිසිදු කිරීම.

**අරමුණ:**

නිවාස ඒකක මට්ටමින් ඩෙංගු මදුරුවන් ව්‍යාප්ත විය හැකි ස්ථාන හඳුනාගෙන විනාශ කර තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඇතුළු සුදුසු නිලධාරීන් යොදවමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ව්‍යාප්තිය අවම කර ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම් සිදු කිරීම.

**ඉලක්කගත ආයතන / ස්ථාන: පෞද්ගලික නිවාස**

**ක්‍රියාකාරකම්:**

1. මදුරු කීටයන් බෝවන ස්ථාන සොයා බලා විනාශ කිරීම.
   - උදා:- ඉවතලන ටින්, බෝතල්, පොල්කටු, ප්ලාස්ටික්, පොලිතීන්, භාජන

2. ජලය රැස් කරන භාජන, ටැංකි සහ ළිං, මදුරුවන් ඇතුළු නොවන සේ දැල් මගින් හෝ වෙනත් සුදුසු ආවරණයකින් ආවරණය කිරීම.

3. වතුර ටැංකි, පක්ෂි තටාක, මල් බඳුන්, විසිතුරු බඳුන්, නිතරම පිරිසිදු කර ජලය මාරු කර මදුරු කීටයන් ඇතිවීම වැළැක්වීම.

4. ඉවතලන ටයර් තුලට ජලය නොරැඳෙන සේ වැලි පිරවීම/ සිදුරු කිරීම / ආවරණය සහිත ස්ථානයක තැබීම.

5. වැහිපීලි වල හිරවී ඇති කොළරොඩු සහ ජලය නිතිපතා ඉවත් කිරීම.

6. මදුරුවන් දෂ්ට කිරීමෙන් වැළැකීමට
   - මදුරු විකර්ශක (පැඟිරි තෙල් වැනි) ආලේප කිරීම
   - අත් පා ආවරණය වන ඇඳුම් ඇදීම.
   - මදුරු දැල් භාවිතය (නිදා ගැනීමේදී හා විවේක ගැනීමේදී)

7. වසංගත තත්ව වලදී නිරන්තර සෝදිසිය.
   - මදුරුවන් බෝවිය හැකි තැන් ඉවත් කිරීම.
   - ඉවත් කිරීමට අපහසු ස්ථාන වලට රසායනික ද්‍රව්‍ය (කීට නාශක) යෙදීම.
   - ධූමායනය කරනුයේ වැඩිහිටි මදුරුවා විනාශ කිරීමට පමණක් වන හෙයින් සෑම විටම මදුරුවන් බෝවන ස්ථාන විනාශ කිරීමට අවධානය යොමු කිරීම.

8. අවම වශයෙන් සතියකට වරක් හෝ නිරන්තරයෙන් ගෙවත්ත හා ගෙතුල හොඳින් පරීක්ෂා කොට මදුරුවන් බෝවිය හැකි ස්ථාන ඉවත් කිරීම. (සෑම සතියකම විනාඩි 30 ක් මේ සඳහා යොදවන්න.)

9. වහාම වෛද්‍ය උපදෙස් ලබා ගැනීම.
   - දින දෙකකට වඩා උණ පවතිනම් සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකු හෝ ළඟම ඇති රෝහලට යාම.